දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ඊඩී/1/27/1/5/1/2007

දිනය / திகதி / Date } 2007.12.13

චක්‍රලේඛ අංක : 2007/20
දිනය : 2007.12.13

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පාසල්වල විදුහල්පතිවරුන් හා
සියලුම පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන් වෙත,

## ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය

අධ්‍යාපන ක්‍රියාවලිය වඩාත් ඵලදායක අන්දමින් සිදු කළ හැකි වන පරිදි හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ ගුරු භවතුන්ගේද උපරිම සුබ සාධනය සැලසෙන පරිදි ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක් සකස් කළ යුතු යැයි රජය තීරණය කොට තිබේ. ඒ අනුව මෙම ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය පහත සඳහන් මූලික කරුණු මත පදනම් විය යුතු යැයි අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කොට තිබේ.

**1. ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය පහත සඳහන් මූලික කරුණු මත පදනම් විය යුතු වේ.**

1.1 අධ්‍යාපනය සෑමවිටම ශිෂ්‍ය කේන්ද්‍රීය විය යුතු බැවින් ගුරු භවතුන්ගේ ස්ථාන මාරු ලබා දීමේ දී ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා මුඛ්‍ය ස්ථානයෙහි ලා සැලකිය යුතු ය.

1.2 අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ කාර්යය රඳා පවතින්නේ ගුරුභවතුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප මත බැවින් ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් ගුරුභවතුන්ට සිය දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා අවකාශ සැලසිය යුතු ය.

1.3 ගුරුභවතුන්ට වෘත්තීය සුරක්ෂිතභාවය පිළිබඳ විශ්වාසය තහවුරු වන ආකාරයට සහ ශාස්ත්‍රීය නිදහස ආරක්ෂා වන ආකාරයට අසාධාරණ ගුරු මාරු පිළිබඳ අනිසි බියකින් තොරව සේවය කළ හැකි වන පරිද්දෙන් සහ සේවා තෘප්තිය උපරිම අයුරින් හිමි කර ගත හැකි වන ආකාරයෙන් ද ගුරු ස්ථානමාරු ප්‍රතිපත්තිය සකස් විය යුතු ය.

1.4 අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රදේශගතව දක්නට ලැබෙන විෂමතා හැකිතාක් දුරට අවම කරලීම මෙන්ම ශිෂ්‍ය මූලික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව හා අඛණ්ඩව සිදුවීම ගුරු ස්ථානමාරු ප්‍රතිපත්තියේ මූලික අරමුණක් විය යුතු ය.

1.5 කිසියම් ප්‍රදේශයකට හා පාසලකට සීමා වී ඇති මානව සම්පත් දිවයිනේ අනෙක් ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවටද ප්‍රයෝජනවත් වන ආකාරයට ගුරු සේවයේ නියුතු මානව සම්පත් සාධාරණ පරිද්දෙන් බෙදී යන බවට ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් වග බලා ගත යුතුය.

1.6 එකම ප්‍රදේශයක හෝ විදුහලක අඛණ්ඩව සේවය කිරීමෙන් ඇතිවන ඒකාකාරී බව ගුරු වෘත්තීය සංවර්ධනය කෙරෙහි ද අහිතකර ලෙස බලපාන බැවින් විවිධ ප්‍රදේශවල, විවිධ සමාජ ආර්ථික හා සංස්කෘතික පරිසරවල ඇති විදුහල්වල සේවය සඳහා අවකාශ සැලසීමටත් නොයෙකුත් අත්දැකීම් ලබාගනිමින් තම කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමටත් සියලුම ගුරුවරුන්ට අවස්ථා ලැබිය යුත්තේ ය.

1.7 ක්ෂේත්‍රයේ මානව සම්පත් විධිමත් කළමනාකරණය තුළින් උපරිම කාර්යක්ෂමතාවය කෙරෙහි යොමු කරලීම සඳහා මෙම ප්‍රතිපත්තිය මගින් අවකාශ සලස්වා දිය යුතු ය.

1.8 ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය විධිමත් ව හා විනිවිද භාවයකින් යුක්තව ගුරු මාරු මණ්ඩලය මගින් ම ක්‍රියාත්මක කළ යුතු ය.

## 2. ගුරුමාරු මණ්ඩල

### 2.1 ගුරු මාරු මණ්ඩල ස්ථාපනය

ඉහත සඳහන් අරමුණු හා පරමාර්ථ ඉටු කිරීම සඳහා පහත සඳහන් මට්ටම්වල දී ගුරුමාරු මණ්ඩල ස්ථාපනය කොට ක්‍රියාත්මක කළ යුතු ය.

i. කලාපීය අධ්‍යාපන කාර්යාලය
ii. පළාත් අධ්‍යාපන කාර්යාලය
iii. ජේ‍යෂ්ඨ අමාත්‍යාංශය

### 2.2 අන්තර් පළාත් ගුරු මාරු සංඛ්‍යා නිශ්චය කිරීමේ මණ්ඩලය

මෙහි දී අන්තර් පළාත් ගුරුමාරු සංඛ්‍යා නිශ්චය කිරීමේ මණ්ඩලය යන්නෙන් අදහස් වන්නේ පළාත් ගුරු මාරු වීම් සිදුකිරීමේ දී ඒ ඒ පළාත් අතර හුවමාරු කරගත හැකි ගුරු මාරු වීම් සංඛ්‍යාව ගැන එකඟතාව ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු සේවක සංඛ්‍යා කමිටුව විසින් කැඳවනු ලබන පහත සඳහන් සාමාජිකයින්ගේ නියෝජනයෙන් යුත් මණ්ඩලයකි.

1. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
3. ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ
4. ගුරුමාරු මණ්ඩල නියෝජනය කරන වෘත්තීය සමිති නියෝජිතයන්

ඉහත නිලධාරීන්ට මෙම මණ්ඩලයේ රැස්වීම් සඳහා නොපැමිණිය හැකි අවස්ථාවක දී පමණක් එම නිලධාරීන් නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙක් සහභාගි කරවිය හැකි ය. එක් එක් පළාත අතර හුවමාරු කරගත හැකි ගුරු සංඛ්‍යාවන් ඒ ඒ වර්ග අනුව නිශ්චය කිරීම මෙම මණ්ඩලය විසින් සිදුකළ යුතු ය. අනතුරුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම සංඛ්‍යාවලට අදාළව කරනු ලබන ගුරු මාරු වීම් සඳහා ගුරු මාරු මණ්ඩල නිර්දේශ ලබාගෙන පළාත් රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 2.3 ගුරු මාරු මණ්ඩල සංයුතිය

ආයතන සංග්‍රහයේ iii වන පරිච්ඡේදයේ 3.5 ඡේදයෙහි සඳහන් විධිවිධානවලට අනුකූල විය යුතු ය. එනම්,

3.5 අ. මෙම මාරු මණ්ඩලයක්, ස්ථාන මාරු අභියාචන මණ්ඩලය සඳහා නම් කරන ලද නිලධාරියෙකු හැරුණු විට කළමනාකරණ අංශයේ නියෝජිතයින් දෙදෙනෙකු (එනම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ප්‍රධානියෙකු හා දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු භාර මාණ්ඩලික නිලධාරියා) ගෙන් ද,

ආ. (i) දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රස්තුත සේවයේ නියුක්ත මුළු නිලධාරී සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින යථෝක්ත දෙපාර්තමේන්තුවට නොහොත් සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයෙන්

හෝ,

(ii) පූර්ණ කාලීන ව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සංගමයේ

හෝ,

නියෝජිතයෙකුගෙන් ද සමන්විත විය යුතු ය.

### 2.4 ගුරු මාරු මණ්ඩල ක්‍රියාකාරීත්වය

(i) ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මාරු මණ්ඩල ක්‍රියාකාරීත්වය ආයතන සංග්‍රහයේ iii වන පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති ප්‍රකාර ව සිදුකිරීම අවශ්‍ය වේ. එහෙත් කිසියම් ගුරු භවතෙකුට විරුද්ධ ව විනයානුකූල ක්‍රියාමාර්ගයක් හෝ හුදෙක් ම සේවා අවශ්‍යතාව මත ඉතා හදිසි හා සුවිශේෂී අවස්ථාවක් හෝ ගුරුභවතෙකුගේ ඉල්ලීමක් සහිත ව සෞඛ්‍ය හේතුවක් මත (වෛද්‍ය මණ්ඩලයක නිර්දේශවලින් තහවුරු වන) හෝ සිදු කළ යුතු වන ස්ථාන මාරු අදාළ බලධාරීන් විසින් ම තීරණය කොට ක්‍රියාත්මක කළ යුතු ය. එහෙත් සේවයේ අවශ්‍යතාව මත කරනු ලබන ගුරුවරුන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් වුව ද සති 2 ක් ඇතුළත ඒ පිළිබඳ ගුරුමාරු මණ්ඩලය දැනුවත් කළ යුතු ය.

(ii) වඩාත් පහසු පාසල් වර්ගයකට අයත් පාසලකට ගුරුභවතුන් ස්ථානගත කිරීමේ දී ඔවුන්ගේ නිර්මාණශීලීත්වය විවිධ ක්ෂේත්‍රවල දී සිදුකරන ලද පරීක්ෂණ හා පාසල් ප්‍රජාවට සිදුකරන ලද කාර්ය සාධනය පදනම් කරගත හැකි අයුරින් කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කළ යුතු ය.

**2.5 අභියාචනා මණ්ඩලයක සංයුතිය**

මාරු මණ්ඩලය නියෝජනය කරන ලද එක් නිලධාරියෙකුගෙන් ද, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරන ලද මාරු මණ්ඩලය නියෝජනය නොකළ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගෙන් ද, වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් ද සමන්විත විය යුතු ය.

## 3. ගුරුමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී සලකා බැලිය යුතු විශේෂ කරුණු/සාධක

ගුරුමාරු සිදු කිරීමේ දී පහත දැක්වෙන කරුණු/සාධක කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

**3.1 පාසල් වර්ගීකරණය**

ED/3/37/9/2/3(i) අංක දරණ 2005.01.18 දිනැති 2005/1 දරණ චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් පහත දැක්වෙන පාසල්

i. අති දුෂ්කර පාසල් වර්ගය
ii. දුෂ්කර පාසල් වර්ගය
iii. අපහසු නොවන පාසල් වර්ගය
iv. පහසු පාසල් වර්ගය
v. වඩාත් පහසු පාසල් වර්ගය

යනුවෙන් වර්ග 5 ක් යටතේ වර්ගීකරණය වන බව සැලකිල්ලට ගත යුතු ය. එමෙන් ම ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත කාලීන ව මාරු මණ්ඩලය මගින් සිදු කෙරෙන පාසල් වර්ගීකරණයන් ඒ ඒ අවස්ථාවන්හි දී අදාළ කරගත යුතු වේ.

**3.2 සේවාකාලය පිළිබඳ කරුණු**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ගුරු සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් ස්ථාවර කමිටුව විසින් නම් කරනු ලබන පාසලක අනිවාර්ය අවම සේවා කාලයක් සෑම ගුරුභවතෙකු විසින් ම සේවය කළ යුතු වේ. ඒ අනුව,

i. අති දුෂ්කර පාසලක හෝ දුෂ්කර පාසලක - (අවුරුදු 03 අවම)
ii. අපහසු නොවන පාසල් වර්ගයට අයත් පාසලක - (අවුරුදු 04 අවම)
iii. පහසු පාසල් වර්ගයට අයත් පාසලක - (අවුරුදු 08 උපරිම)
iv. වඩාත් පහසු පාසල් වර්ගයට අයත් පාසලක - (අවුරුදු 06 උපරිම)

වශයෙන් සලකමින් ගුරු භවතුන්ගේ සේවා කාලය නියම කිරීම අවශ්‍ය වේ.

**3.2.1**

පාසල් පාදක ගුරු බඳවා ගැනීම් ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා අවස්ථාවල දී පත්වීම් ලිපියේ සඳහන්වන කොන්දේසි අනුව පත්කරන ලද පාසලේ එක දිගට සේවය කළ යුතු වසර ගණන සම්පූර්ණ කළ යුතු ය.

**3.3 දුෂ්කර පාසල් සේවය වෙනුවෙන් වූ දිරි ගැන්වීම්**

ඉහත වර්ග කරන ලද දුෂ්කර හෝ අති දුෂ්කර හෝ පාසලක අනිවාර්ය සේවා කාලයක් සෑම ගුරුභවතකු විසින් ම සම්පූර්ණ කළ යුතු වන අතර එම අනිවාර්ය සේවා කාලයෙන් පසු අති දුෂ්කර හෝ දුෂ්කර පාසලක සේවය කරන ගුරුභවතෙකුට දුෂ්කර දීමනා ගෙවිය යුතු ය. මෙම දීමනාව එම අති දුෂ්කර හෝ දුෂ්කර හෝ පාසලේ සේවය කරනතාක් කල් නොකඩවා මාසික ව ගෙවිය යුතු අතර ඒ සඳහා 2005.10.18 දිනැති 2005/02 චක්‍රලේඛයෙන් හා 2006/44 චක්‍රලේඛයේ විධි විධාන පිළිපැදිය යුතු ය. ඒ අනුව අති දුෂ්කර පාසලක සේවය සඳහා එක් ගුරුභවතෙකුට මාසික ව රු. 2,500/= ක දීමනාවක් ද දුෂ්කර පාසලක සේවය සඳහා මාසික ව රු. 1,500/= ක දීමනාවක් ද ගෙවිය යුතු ය. එහෙත් අධ්‍යාපන ලේකම් විසින් දුෂ්කර හා අති දුෂ්කර පාසල් සේවය සඳහා වරින් වර දෙනු ලබන දිරි ගැන්වීම් ද මීට අමතර ව විශේෂයෙන් සලකා බැලිය යුතු ය.

### 3.4 වෙනත් කරුණු

i. වයස අවුරුදු 55 ඉක්මවා ඇති ගුරු භවතුන් ඔවුන්ගේ ඉල්ලීමට හැර ස්ථාන මාරු නොකළ යුතු ය.

ii. සෞඛ්‍ය හේතූන් මත කිසියම් ගුරු භවතකු විසින් ස්ථාන මාරුවක් ඉල්ලා සිටින විටක දී තම සෞඛ්‍ය තත්ත්වය තහවුරු කිරීම පිණිස රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශය ලබාගත යුතු ය. ගර්භණී මාතාවක් සම්බන්ධයෙන් වූ කළ ඇයගේ අභිමතයෙන් තොර ව ස්ථාන මාරු නොකළ යුතු ය. කෙසේ වෙතත් ගර්භණී මාතාවක විසින් ස්ථාන මාරුවක් ඉල්ලන අවස්ථාවක දී කටයුතු කළ යුත්තේ වෛද්‍ය වාර්තාවන්ගෙන් සනාථ වන කරුණු පදනම් කොට ගෙන වේ. දරුවෙකු ලැබූ මාතාවකට එම දරුවා ලැබී වසරක් යන තෙක් තමාගේ ස්ථිර පදිංචියට ආසන්න පාසලකට තාවකාලික සේවා අනුයුක්ත කිරීමක් ලබාගැනීමේ හිමිකම් ලබා දිය හැකි ය. ඒ සඳහා ගුරු මාතාව විසින් අභියාචනයක් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය ය. ගුරු භවතාගේ පෞද්ගලික සෞඛ්‍යයට අමතර ව ගුරුභවතා සමග එක්ව සිටීම කෙළින් ම බලපෑ හැකි මට්ටමේ සිටින පහත සඳහන් පවුලේ සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ද ස්ථාන මාරු ලබා දීම සඳහා සලකා බලනු ලැබිය හැකි ය.

1. කලත්‍රයා
2. දරුවන්
3. දෙමාපියන්/කලත්‍රයාගේ දෙමව්පියන්

iii. මුල් පත්වීම
ගුරුවරයෙකු වශයෙන් බඳවාගැනීමේ දී මුල් පත්වීම අති දුෂ්කර හෝ දුෂ්කර යන ගණයට අයත් පාසලක අදාළ අවම කාල සීමාවකට යටත් කොට එබඳු පාසලකට ලබා දිය යුතු අතර අවම සේවා කාලය සම්පූර්ණ කළ පසු එම ගුරු භවතාට තමා කැමති පාසලකට ස්ථාන මාරු ලබාගැනීමට හැකි විය යුතු ය.

iv. මෙම ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියෙහි සිද්ධාන්තයට යටත් ව සෑම ගුරු මාරු මණ්ඩලයක් විසින් ම සිය කාර්යභාරයට අදාළ ව කාර්ය පටිපාටි සංග්‍රහයක් සකස් කොට ගෙන ඒ අනුව කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය මත පිහිටා සිටිය යුතු ය.

v. අතිරික්ත හා විෂයානුබද්ධ ගුරු තුලනය සඳහා එක් එක් විෂයයක් සඳහා වූ විෂයය අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කළ යුතු ය. ඔවුන් මගින් ලබා ගන්නා නිර්දේශ මත අතිරික්ත හා විෂයානුබද්ධ ගුරුතුලන කටයුතු සඳහා නිර්දේශ ලබාගත යුතු අතර එම තුලන කටයුතු ගුරු ස්ථාන මාරු මණ්ඩලය මගින් සිදුකළ යුතු ය. එමෙන් ම අතිරික්ත හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ගුරු ස්ථාන මාරු මණ්ඩල නියෝජිතයන් විසින් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම අවශ්‍ය වේ. එම ක්‍රමවේදය ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට අනුකූල ව සිදුවිය යුතු ය. විදුහල්පතිවරයා හා අතිරික්ත ගුරුභවතා විසින් සම්පූර්ණ කරන ලද තොරතුරු පත්‍රිකාවක් අතිරික්ත ගුරුභවතුන් විෂයානුබද්ධ ව තුලනය කිරීමේ දී පදනම් කරගත යුතු ය. එම තොරතුරු සලකා බලා ගුරු මාරු මණ්ඩලය මගින් ස්ථාන මාරුව ලබා දිය යුතු අතර ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ගුරුභවතා හට අවස්ථාව සලසා දිය යුතු ය.

vi. ස්ථාන මාරුවක් ලද ගුරුභවතෙකු එම ස්ථාන මාරුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක, එම අභියාචනයට අභියාචනා මණ්ඩලයෙන් පිළිතුරක් ලැබෙන තෙක් දැනට සේවය කරන පාසලේ සේවය කිරීමට ඉඩ සළසා දිය යුතු ය. අභියාචනා මණ්ඩලයේ තීරණය ස්ථාන මාරු ලබා දුන් දින සිට මසක් ඇතුළත අදාළ ගුරුභවතාට ලබා දිය යුතු ය.

vii. අතිරික්තය හඳුනාගැනීම 3.2 වගන්තියේ සඳහන් සේවා කාලය පදනම් කරගනිමින් සිදුකළ යුතු අතර පාසල්වල තවදුරටත් ගුරු අතිරික්තයක් ඇතිවන පරිදි ගුරු ස්ථානගත කිරීම් සිදු නොකළ යුතු ය.

## 4. ස්ථාන මාරු සිදුකරන කාලසීමාව

ඉහත 2.4 ඡේදයේ විශේෂිත කොට දක්වා ඇති අවස්ථාව සඳහා හැර අන් සෑම අවස්ථාවක දී ම ගුරුවරුන්ගේ ස්ථාන මාරු ක්‍රියාවලිය නිසා ශිෂ්‍යයන්ට ද ගුරුභවතුන්ට ද ඇති විය හැකි අපහසුතාවන් අවම කරනු පිණිස ගුරුමාරු ක්‍රියාවලිය සෑම වර්ෂයක ම මැයි මස 31 වැනි දින ආරම්භ කොට නොවැම්බර් මස 01 වැනි දින අවසන් කළ යුතු වේ. (ඊළඟ වර්ෂයේ ජනවාරි මස 01 සිට ක්‍රියාත්මක කළ යුතු වේ.)

**4.1 ගුරු මාරු කිරීම් ක්‍රියාවලියට අදාළ කාලරාමුව**

වාර්ෂික ගුරු ස්ථාන මාරු සිදු කිරීමට අදාළ දින වකවානු පහත පරිදි වේ.

| කාරණය | | දින වකවානු |
|---|---|---|
| 1. | ගුරු මාරුවලට අදාළ සියලු තොරතුරු රැස්කිරීම | මැයි 31 ට පෙර |
| 2. | ගුරු මාරු ඉල්ලුම් පත්‍ර කැඳවීම | ජූනි 01 - ජූනි 30 අතර |
| 3. | මාරු මණ්ඩල රැස්වීම | ජූනි 01 - ජූලි 31 අතර |
| 4. | මාරු මණ්ඩල නිර්දේශය ලබා දීම | අගෝ. 01 - අගෝ. 15 අතර |
| 5. | මාරුවීම් ලිපි නිකුත් කිරීම | සැප්. 15 - සැප්. 30 අතර |
| 6. | අභියාචනා භාර ගැනීම | ඔක්. 01 - ඔක්. 15 අතර |
| 7. | අභියාචනා මණ්ඩල තීරණ ලබා දීම | නොවැ. 01 දිනට පෙර |

සාමාන්‍ය වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් හැරුණු කොට 2.4 යටතේ දක්වා ඇති විශේෂ අවස්ථාවල දී සිදු කෙරෙන ගුරු ස්ථාන මාරු වීම් වඩා කාර්යක්ෂම පරිදි හා ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය පදනම් වූ මූලික කරුණු වලට හානියක් නොවන පරිදි ඉහත කාල රාමුවෙන් බැහැර ව සිදු කළ හැකි ය.

5. මෙම ප්‍රතිපත්තියෙහි වෙනස් ව සඳහන් කර ඇති අවස්ථාවන්හි දී හැර අනෙකුත් සෑම අවස්ථාවක දීම ගුරුවරුන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 111 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගත යුතු ය.

6. මෙම ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය 2008.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලාත්මක විය යුතු ය. එබැවින් ගුරුවරුන්ගේ ස්ථාන මාරු පිළිබඳ ක්‍රියාකරන සෑම නිලධාරියෙකු විසින් ම මෙම ප්‍රතිපත්තියට අනුකූල ව ක්‍රියා කරනු ලැබිය යුතු බව දන්වමි.

7. මෙම ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ ප්‍රතිපත්තියක් බැවින් පළාත් මට්ටමින් ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන යම් ගුරුමාරු ප්‍රතිපත්තියක් සකස් කර ගන්නේ නම් එකී ප්‍රතිපත්තියේ කිසිදු කරුණක් ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියේ කරුණු අභිබවා නොයා යුතු ය.

**එම්.එම්.එන්.ඩී.බණ්ඩාර**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

පිටපත් : විගණකාධිපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
මුදල් කොමිෂන් සභාවේ ලේකම්,
අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය,
විභාග කොමසාරිස් ජනරාල්,
ප්‍රකාශන කොමසාරිස් හා නි.අ.අ.ජ.,
ලේකම් ජාතික අධ්‍යාපන කොමිසම,
අධ්‍යක්ෂ ජනරාල් ගුරු පුහුණු අධිකාරිය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අංශ භාර නිලධාරීන්,
ලේකම් ගුරු සේවක සංඛ්‍යා කමිටුව,
ලේඛනාගාරය
වෘත්තීය සමිති නියෝජිතයින්